# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1912/31 - 2015 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2015.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මගින් සංශෝධිත, 1969 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (3) වැනි උපවගන්තිය සහ 14 වැනි වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 20 වන වගන්තිය යටතේ, අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

රවි කරුණානායක,
මුදල් අමාත්‍ය.

2015 අප්‍රේල් මස 30 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

නියෝග

01. 2013 ජුනි මස 05 වැනි දිනැති අංක 1813/14 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, 2013 ජුනි මස 05 වැනි දින සිට බලපැවැත්වෙන විශේෂ ආනයන බලපත්‍ර නියෝග තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:

02. අපනයනය සඳහා සැකසීමට තාවකාලිකව භාණ්ඩ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය (Temporary Importation for Export Processing Scheme - TIEP) යටතේ ආනයනය කරන ලද පහත සඳහන් අයිතම 2013 ජුනි මස 05 වැනි දිනැති අංක 1813/14 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, අංක I දරන උපලේඛනයේ සඳහන් අංක I, II සහ III වන තීරයට මෙයින් ඇතුලත් කරනු ලැබේ.

| | I තීරය<br>ශීර්ෂ අංකය | II තීරය<br>සංයෝජිත<br>වර්ගීකරණ<br>සංකේතය | III තීරය<br>විස්තරය | ICL |
|---|---|---|---|---|
| | 08.02 | 0802.80 | පුවක් | |
| | | 0802.80.10 | අළුත් පුවක් (පොත්ත රහිත හෝ පොතු ඉවත් කරන ලද) | L |
| | | 0802.80.90 | අනෙකුත් පුවක් | L |

03. ආනයන හා අපනයන බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් වූ අංක 1518/4 දරන 2007.10.08 දිනැති අති විශෙෂ ගැසට් පත්‍රය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ:

| | සංයෝජිත<br>වර්ගීකරණ<br>සංකේතය | විස්තරය | බලපත්‍ර ගාස්තුව |
|---|---|---|---|
| | 0802.80 | පුවක් | |
| | 0802.80.10 | අළුත් පුවක් (පොත්ත රහිත හෝ පොතු ඉවත් කරන ලද) | කි.ග්‍රෑමයට රු. 26 |
| | 0802.80.90 | අනෙකුත් පුවක් | කි.ග්‍රෑමයට රු. 26 |

04. මෙම සංශෝධනය 2015 මැයි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

05 - 425

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.